Women and Media Collective
Established 1984

**ආර්ථික සහ සමාජ අයිතිවාසිකම් සහ වත්මන් අර්බුදය**

# ආර්ථික සහ සමාජීය අයිතිවාසිකම් සහ වත්මන් අර්බුදය: IMF සාකච්ඡා සඳහා මානව හිමිකම් ප්‍රවේශයක් යනු කුමක්ද?



ලංකාවේ අත්‍යාවශ්‍ය භාණ්ඩ සඳහා දිගු පෝලිම්

ශ්‍රී ලංකීය අර්බුදය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF)සාකච්ඡාවලින් ගම්‍ය වන දේ අවබෝධ කර ගැනීම සඳහා, **කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (ශ්‍රී ලංකාව)** විසින් **NYU Gallatin Human Rights Initiative (New York)** සමඟ සාකච්ඡාවකට අනුග්‍රහය දක්වන ලදී. **රාධිකා කුමාරස්වාමි** සහ **වාසුකී නේසයියා** විසින් ප්‍රධානත්වය දරන ලද **දීපිකා උඩගම, පිලිප් ඇල්ස්ටන් සහ මයිකල් ෆක්රි** යන අයගෙන් සමන්විත වූ මණ්ඩලය විසින් රටේ සමාජීය වියදම් සහ මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධව ගත හැකි කප්පාදු කිරීමේ පියවරවල හානිදායක බලපෑම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් යනු ආර්ථික ස්ථාවරත්වය ලබා දෙන අතර ආර්ථික ස්ථාවරත්වයේ ප්‍රතිඵලයක් නොවේ. ජනතාවගේ සමාජ සහ ආර්ථික අයිතිවාසිකම් යන දෙකටම ප්‍රමුඛත්වය දෙමින් සුදුසු සැලැස්මක් සැකසීම ඉදිරි ගමනේ අවසාන මාර්ගයයි.**

ආර්ථික අර්බුදය යනු පාලනයේ මෙන්ම බොහෝ සංවරණ සහ තුලනයන් ඉවත් කළ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පවතින විධායක ජනාධිපති ක්‍රමයේ අර්බුදයකි. එබැවින්, **ආර්ථික සහ සමාජීය අයිතීන් ඇතුළු සියලු අයිතීන් ඉල්ලා සිටීමට හැකි වන පරිදි අදහස් ප්‍රකාශ කිරීමේ, සංගමයේ සහ රැස්වීමේ නිදහස පිළිබඳ අයිතිවාසිකම් බෙදිය නොහැකි බව කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.** ඓතිහාසිකව මානව හිමිකම් ප්‍රජාව විසින් ආර්ථික සහ සමාජීය අයිතීන් කෙරෙහි යොමුකොට ඇත්තේ අල්ප වූ අවධානයකි. **එබැවින් මානව හිමිකම් ප්‍රජාවට IMF සමග සම්බන්ධ වීමට හැකි විය යුතු තරමටම, ආර්ථික සහ සමාජීය අයිතීන් මානව හිමිකම් මෙන්ම වැදගත් වන බව විරෝධතාකරුවන් දැනුවත්ව සිටීම ද වැදගත් ය.**

**සංස්ථායික ප්‍රතිසංස්කරණය IMF හි නිල පේර්ෂණවලින් පිටත පවතින අතර සාකච්ඡාවන් මගින් ඒකාධිපති ක්‍රමයකින් ඉවත් වීමට අවශ්‍ය වන ගැඹුරු සංස්ථායික ප්‍රතිසංස්කරණයක් පිළිබඳ දැනුම් නොදෙනු ඇත.** මීට අමතරව, IMF සහ ලෝක බැංකුව විසින් ප්‍රජාව තුළ සිටින දිළිඳු කොටස්වලට කිසිදා සේවය නොසලසන නව ලිබරල් හරයන් සහ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරයි. උපදේශන වාර්තාවේ සඳහන් වන සමාජ ආරක්ෂණ ජාලයන් ව්‍යවස්ථාපිතව පිළිගෙන ඇති සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සඳහා පදනමක් සකස් කරන ආර්ථික සහ සමාජ අයිතීන් සම්බන්ධයෙන් ඉතා සීමිත සම්බන්ධතාවක් දරයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් මෙය හඳුනාගෙන නොමැති බව අවබෝධ කරගන්නා අතරම, මෙම කඩිනම් ක්‍රියාමාර්ගය සඳහා අප බල කරන්නේ කෙසේද යන්න සහ තවදුරටත් විනාශවීම වළක්වා ගන්නේ කෙසේද යන්න සලකා බලනු ලැබිය යුතුය. කෙසේ වෙතත්, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වෙනුවෙන් පෙනී සිටීම කාලය ගතවන්නක් බැවින් ඒ වන විට පෞද්ගලීකරණය සිදු වී තිබෙනු ඇති අතර **අවම ආර්ථික මට්ටමේ සිටින ජනතාව වෙත විශාල ලෙස උද්ධමනය වූ පිරිවැයක් යටතේ ඉතා පහත් සේවාවන් සැපයෙනු ඇත.**

එබැවින් තරුණයන් විසින් මෙහෙයවනු ලබන ඓන්ද්‍රීය විරෝධතා අරගලයට ප්‍රධාන වන අතර **සහයෝගීතාවය එක්රැස් කිරීමේ සහ පුළුල් කිරීමේ නව්‍ය යාන්ත්‍රණ සඳහා සැලැස්මක් ද ඒ සමග වේ.** තීරණ ගැනීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන් ජනතා ව්‍යාපාර සහ වෙළඳ සංගම් අතර අන්තර්ග්‍රාහී සාකච්ඡාවලින් අනතුරුව IMF සහ ජාතික ආණ්ඩුව අතර පවත්වන සාකච්ඡාවල විනිවිදභාවය වැදගත් වේ. මානව හිමිකම් යනු අවසානයේ ජනතා බලය වන අතර අපගේ උත්සුකයන් මානව හිමිකම්වලට අනුව හැඩගැසිය යුතුය.

**ආර්ථික ස්ථාවරත්වය මානව හිමිකම් සඳහා පූර්ව කොන්දේසියක් ලෙස IMF සලකයි.** කෙසේ වෙතත්, ආර්ථික ස්ථාවරත්වය ලබා දෙන්නේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම්වලින් වන අතර ඒවා ආර්ථික ස්ථාවරත්වයේ ප්‍රතිඵලයක් නොවේ. ආණ්ඩුවේ සහ IMF හි වගවිය යුතු බව පවත්වාගෙන යාම සඳහා විශේෂ වාර්තාකරුවන් සහ විශේෂ ක්‍රියා පටිපාටිවල සහය සමඟින්, ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී සාමූහිකයේ යෝජනාව වැනි යෝජනා භාවිතා කළ හැක.

**IMF මත මහජන පීඩනය තබා ගැනීම ඉතා වැදගත් වේ.** සාකච්ඡා ක්‍රියාවලීන් ප්‍රජාතන්ත්‍රවාදී නොවන බැවින්, මහජනතාව විසින්ම නිර්මාණය කරන ලදප්‍රසිද්ධ යම් සැලසුම්වලට එරෙහිව ඒවා මැනිය යුතු වේ. ඇත්ත වශයෙන්ම දූෂණයෙන් සහ ස්වයං සේවා ප්‍රතිපත්තිවලින් පීඩා විඳි අයට යහපත් ජීවිතයක් ගෙන ඒමට හැකි වන ප්‍රායෝගික ඉලක්කයක් එම පෙළපාලිවලට ඇති බව සහතික කර ගැනීම පිණිස **මානව හිමිකම් ප්‍රජාව විසින් ආර්ථික සහ සමාජ අයිතීන් ආරම්භක ලක්ෂ්‍යයක් ලෙස පිළිගත යුතු ය.**